# රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව
# பதிவாளர் நாயகம் திணைக்களம்
# REGISTRAR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல / My No. RG/MBD/1/චක්‍රලේඛ

ප්‍රධාන කාර්යාලය
தலைமை அலுவலகம்
HEAD OFFICE

තැ. පෙ. අංකය / த. பெ. இல. / P O Box No 565

ඔබේ අංකය / உமது இல / Your No

234/A3, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
234/A3, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்லை
234/A3, Denzil Kobbakaduwa Mawatha, Battaramulla.

දිනය / திகதி / Date 2023.01.31


චක්‍රලේඛ අංකය - 02/2023

සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන්/දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් මගින්,

සියළුම අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරුන්.

**බී 24 ආකෘතිය මගින් ග්‍රාම නිලධාරී විසින් වාර්තා කරනු ලබන මරණ ලියාපදිංචි කිරීමේ දී රෙජිස්ට්‍රාර්වරයාගේ කාර්යභාරය.**

1951 අංක 17 දරණ උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ පනතේ 46(1) වගන්තිය ප්‍රකාරව තම කොට්ඨාසය තුළ සිදුවන මරණ පිළිබඳව දින 7 ක් ඇතුළත පළමුවන උපලේඛනයේ "ම" ආකෘතිය (බී 24) මගින් අදාළ රෙජිස්ට්‍රාර්වරයාට වාර්තා කිරීම ග්‍රාම නිලධරින්ගේ වගකීම වේ.

02. එසේම පනතේ 31 වගන්තිය ප්‍රකාරව මියගිය තැනැත්තා අවසන් වරට රෝගීව සිටියදී ප්‍රතිකාර කළ වෛද්‍යවරයකු සිටිනම් එම වෛද්‍යවරයාට පනතේ පළමුවන උපලේඛනයේ "ඔ" ආකෘතියට ( බී 12) අනුකූල වූ සහතිකයක් නිකුත් කළ හැකි අතර එමගින් මරණයට හේතුව නිශ්චිතව ලබා ගත හැකිය. මෙලෙස 31 වන වගන්තියට අනුකූල වූ වෛද්‍ය සහතිකයක් ඉදිරිපත් නොකරන අවස්ථාවන්හි දී බී 155 ප්‍රශ්නාවලිය මගින් තොරතුරු ලබාගෙන මරණයට හේතුව පැහැදිලිව සටහන් කිරීම රෙජිස්ට්‍රාර්වරයාගේ කාර්යයක් වේ.

03. මේ අනුව නිවෙස්තුළ සිදුවන හදිසි මරණ නොවන ස්වභාවික මරණ ලියාපදිංචි කිරීමේ දී ග්‍රාම නිලධාරී විසින් නිකුත් කරනු ලබන බී 24 වාර්තාව මරණය දැනුම්දීමේ ලියවිල්ලක් වශයෙන් භාර ගෙන වෛද්‍යවරයකු විසින් නිකුත් කරනු ලබන බී 12 ආකෘතියට අනුකූල වූ සහතිකයක් මගින් හෝ බී 155 ප්‍රශ්නාවලිය මගින් මරණයට හේතුව පැහැදිලිව ලබාගෙන මරණය ලියාපදිංචි කළ යුතුය.

04. ඉන් අනතුරුව මරණ ලියාපදිංචි කිරීමේ ලේඛණයේ තුන්වන පිටපත අදාළ පාර්ශ්වයට භාරදිය යුතු අතර දෙවන පිටපතට බී 24 වාර්තාව හා බී 12 සහතිකය හෝ බී 155 ප්‍රශ්නාවලිය අමුණා ඊළඟ මස 10 වන දින හෝ එම දිනට පෙර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත භාරදිය යුතුය.

05. කරුණාකර මෙම චක්‍රලේඛය පිළිබඳව සියලුම කොට්ඨාස රෙජිස්ට්‍රාර්වරුන් ග්‍රාම නිලධාරීන් හා අදාල සෞඛ්‍ය බලධාරීන් දැනුවත් කරන්න.

පී.එස්.පී.අබේවර්ධන
රෙජිස්ට්‍රාර් ජනරාල්

පිටපත්

1. ලේකම්, රාජ්‍ය පරිපාලන ස්වදේශ කටයුතු පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය -ග්‍රාම නිලධාරීවරුන් මේ සම්බන්ධයෙන් දැනුවත් කිරීමට හා කාරුණික දැ.ගැ.ස.
2. ලේකම්, සෞඛ්‍ය අමාත්‍යාංශය - අ.ක.ස. හා කාරුණික දැ.ගැ.ස.


දුරකථන අංකය / தொலைபேசி இல. / Telephone No. 2889488, 2889489
ෆැක්ස් අංකය / தொலைநகல் / Fax No. 2889491
වෙබ් අඩවිය / இணையத்தளம் / Website www.rgd.gov.lk
විද්‍යුත් තැපෑල / மின்னஞ்சல் / E-mail rgd@sltnet.lk, rg@rgd.gov.lk